දිවයින

සංගණනයට එක් වූ අලුත්ම ජන වර්ගය 'මලයහම් තමිලර්'

වසර දෙසිය එකකුත් තවත් මාස කිහිපයක් ගෙවී ඇති මොහොතක කඳුකර දෙමළ ජනතාව වෙතට සුබ ආරංචියක් ගෙන ගියේ ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවයි. ඒ මේ දිනවල පැවැත්වෙන ජන සංගණනයේ ජන වාර්ගික ලැයිස්තුවට 'මලයහම් තමිලර්/ මලයහ දෙමළ' ජන වර්ගයක් ලෙස ඇතුළත් කර ඇති පණිවිඩයයි. ඉන්දියාව අතහැර ලංකාවේ ජීවත් වන්නට පටන් ගෙන පරම්පරා පහක් ගෙවුණ ද මෙතෙක් කලක් කඳුකර දෙමළ ජනතාව හැඳින්වූයේ ඉන්දියානු දෙමළ යන නාමයෙනි. ඉන්දියානු දෙමළ ලෙසින් හැඳින්වීම නිසා ඔවුන්ට හිමි වූ දේට වඩා අහිමි වූ දේ බොහෝය. මේ ඉඩ වෙන් වන්නේ ඒ නාමකරණයෙන් හිමිකම් අහිමි වූ කඳුකර දෙමළ ජනතාව වෙනුවෙනි.

එයම තමයි විය යුත්තේත්. අපි කියන්නේ අපිටත් ඒ තැන දෙන්න කියලා. අපිටත් ඒ වගේ සළකන්න කියලා. අපිවත් ඒ වගේ පිළිගන්න කියලා. 1948 දී සම්මත වුණ 'පුරවැසි පනත' හේතුවෙන් හා 1964 දී ඉන්දීය රජය හා ශ්‍රී ලංකා රජය එක්ව අත්සන් කළ ඉන්දු ලංකා ගිවිසුම මගින් ශ්‍රී ලංකාවේ හිටපු ඉන්දීය දෙමළ ජනතාවගේ ඡන්ද අයිතිය, පුරවැසි අයිතිය පමණක් නොව අතිශය සංවේදී මානුෂීය කාරණා ද අත්තනෝමතික ලෙස උල්ලංඝනය කෙරුණා. 1948 දී පුරවැසි පනත සම්මත වන අවස්ථාවේ පුරවැසිභාවය සඳහා ඉල්ලුම් කළ 825,000 කින් 134,000ක් පුරවැසිභාවය සඳහා සුදුසුකම් ලැබුවා. පුරවැසිභාවය ලැබුණු පසුවත්

නිසා විශ්වවිද්‍යාලවලට ප්‍රවේශ වීමේදී මුදල් ගෙවීමට සිදු වූ අවස්ථා, රැකියා සඳහා

ගැනීමට හැකි වන්නේ නැත. එයින් ඔවුන්ගේ අනන්‍යතාව නැත්තටම නැති වී යන බව ද ඔහු පවසයි.

දාඩිය මහන්සිය වගුරලා උපයලා

ලැබුණු කෝටාවත් අහිමි වීමේ අවදානමක් තියෙනවා. ජනතාව සමග සාකච්ඡා කර ජනතාවට කරුණු පැහැදිලි කර එකඟතා ඇති කළ යුතුයි. විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය මේ දින වල ඒ සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ කටයුත්තේ නියැළී ඉන්නවා. මොකද ප්‍රජාව දැනුවත් වෙන තරමට බෙදී වෙන් වෙන එක අඩු වෙනවා කියලා අපි හිතනවා."

දිනාගත් සතුටත් සොරාගත් නිලධාරීන්

කඳුකර දෙමළ ජනතාවට විශේෂ වූ අනන්‍යතාවයක ඇති වැදගත්කම පිළිබඳ ඔවුන් එසේ කරුණු කාරණා ඉදිරිපත් කරද්දී ඒ පිළිබඳ අවබෝධයක් හා සැලකිල්ලක් නොමැතිව කටයුතු කළ සංගණන නිලධාරීන් පිළිබඳ අදහස් දැක්වූයේ නුවරඑළිය දිස්ත්‍රික්කයේ පදිංචි සිවිල් සමාජ ක්‍රියාකාරිකයෙක් ලෙස කටයුතු කරන අලගර් සෙල්වරාජු ය.

"මලයහම් දෙමළ" ජනතාව ලංකාවෙ දිස්ත්‍රික්ක 13 කටත් වඩා

හිමිකම් අහිමි වූ කඳුකර දෙමළ ජනතාව වෙනුවෙනි.

ජන සංගණනයේ දී ජන සංඛ්‍යාව එහි භූගෝලීය ව්‍යාප්තිය, ජනවාර්ගික ව්‍යාප්තිය හා ජනගහනයේ විවිධ ප්‍රජා විද්‍යාත්මක සමාජීය ලක්ෂණ මෙන්ම නිවාස පිළිබඳ තොරතුරු සෑම ග්‍රාම නිලධාරී කොට්ඨාශයක්ම ආවරණය වන පරිදි ලබා ගැනීමට කටයුතු කරන්නේ ජාතික ප්‍රතිපත්ති සම්පාදනයට හා සැලසුම් සකස් කිරීමට මෙන්ම රාජ්‍ය පරිපාලනයට අවශ්‍ය බැවිනි. මෙතෙක් ලංකාවේ සමස්ත ද්‍රවිඩ ප්‍රජාව ශ්‍රී ලාංකික දෙමළ හා ඉන්දියානු දෙමළ ලෙස සඳහන් කෙරුණි. නමුත් එලෙස සඳහන් කිරීම තුළින් ඔවුන් ආන්තීකරණයට ලක් වන බව නොරහසකි.

නමට පමණක් ඉන්දිය දෙමළ වූ කඳුකර දෙමළ ජනතාව

ජාතික ප්‍රතිපත්ති සම්පාදනයේ දී ඉන්දියානු දෙමළ ප්‍රජාවට වඩා වැඩි ඉඩක් වෙන් වන්නේ ලාංකික දෙමළ ප්‍රජාවටයි. ඉන්දියානු දෙමළ ප්‍රජාව වැඩි වශයෙන් ජීවත් වන වතුකරය බොහෝ කලක පටන් සම්පත් බෙදී යෑමේ විෂමතාවයෙන් පීඩා විඳියි. මේ කාරණාවට එක් හේතුවක් ලෙස 'මලයහ තමිලර්' ප්‍රජාව පෙන්වා දෙන්නේ ඔවුන්ගේ ජන වර්ගය ඉන්දිය දෙමළ ලෙස සඳහන් කිරීමයි. හැඳින්වීමට පමණක් ඉන්දිය දෙමළ වුවද මේ වන විට ඉන්දියාව හා සබඳකම් පවත්වන පවුල් ඇත්තේ අතලොස්සකි. දීර්ඝ කාලයක් තිස්සේ කළ සාකච්ඡාවල ප්‍රතිඵලයක් ලෙස ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව ඔවුන්ගේ අනන්‍යතාව පිළිගැනීම 'මලයහ තමිලර්' ප්‍රජාව ලත් ජයග්‍රහණයකි.

ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවේ ජන වර්ගයක් ලෙස 'මලයහ තමිලර්' ප්‍රජාවගේ අනන්‍යතාව ඇතුළත් කර ගැනීම වෙනුවෙන් බොහෝ සිවිල් සංවිධාන මැදිහත් විය. ඒ සඳහා මුල් වූ සංවිධාන් අතුරින් එකකි ඌව ශක්ති පදනම. එහි සාමාජිකයකු ලෙස කටයුතු කරන කුරුණෑගල මාවතගම මුවන්කන්ද වතුයායේ ජීවත් වන ජීවරත්නම් සුරේෂ් වෙනම අනන්‍යතාවක අවශ්‍යතාව හා වැදගත්කම පිළිබඳ අදහස් දැක්වූවේය. "මේ දක්වා අපේ ජන වර්ගය සඳහන් කරන විට ඉන්දියානු දෙමළ කියලා සඳහන් කරන්නේ අපි ඉන්දියාවෙන් ආව නිසා. අපි ඉතිහාසය ඉගෙන ගනිද්දි උගන්වනවා බොහෝ ජන වර්ග වෙනත් රටවලින් මෙරටට පැමිණි බව. නමුත් අපි කිසි අවස්ථාවක ඔවුන්ගේ ජන වර්ගය සඳහන් කරන විට ඔවුන් පැමිණි රට ඉදිරියෙන් සඳහන් කරන්නේ නෑ. සඳහා පුළුසුකම් ලැබුවා. පුරවැසිභාවය ලැබුණු පසුවත් ඉන්දියානු දෙමළ ලෙස සඳහන් කිරීම අපට කරන අසාධාරණයක්. ඇත්තටම කිව්වොත් දැන් අපේ ගොඩක් අයට ඉන්දියාවේ ඉන්න ඥාතීන් එක්ක කිසිම සම්බන්ධයක් නෑ.

නාමකරණයෙන් ආන්තීකරණයට ලක්වන ජනවර්ගයක්

මේ ඉන්දියානු දෙමළ කියන සඳහන නිසා මහන්සි වෙලා ඉගෙන ගෙන රටේ ඉහළම තිලකල දැරුවත් ඒ රැකියාවට අදාළ නිසි ගෞරවයවත් නොලැබෙන අවස්ථා තියෙනවා. ඒ නිසාම ඇතැම් අය තමන්ගේ අනන්‍යතාව සඟවා ගෙන ජීවත් වෙනවා. එසේත් නැතිනම් වෙනත් අනන්‍යතාවයකින් පෙනී සිටිනවා. සරලව කියනවා නම් බදුල්ල දිස්ත්‍රික්කයේ ශ්‍රී ලාංකික දෙමළ ලෙසින් පෙනී සිටින විශාල ප්‍රමාණයක් සිටිනවා. ශ්‍රී ලාංකික දෙමළ ජනතාව වැඩි වශයෙන් ජීවත් වන්නේ ලංකාවේ උතුරු නැගෙනහිර ප්‍රදේශයේ. එහෙම නම් කොහොම ද බදුල්ල, නුවරඑළිය, කොළඹ දිස්ත්‍රික්කවල විශාල ප්‍රමාණයක් ශ්‍රී ලාංකික දෙමළ ජනතාව ඉන්නෙ. ඇත්තටම ඒකට හේතු වෙලා තියෙන්නේ ශ්‍රී ලාංකික දෙමළ ජනතාවට ලැබෙන සමාජ පිළිගැනීම ඉන්දියානු දෙමළ ප්‍රජාවට ලැබෙන්නේ නැති එක. ඉන්දියානු දෙමළ ජනතාවට සිදුවන වෙනස් කොට සැලකීම නිසා ඔවුන් ශ්‍රී ලාංකික දෙමළ ලෙසට වෙනස් කර ගැනීමට උනන්දු වෙනවා. ඉන්දියානු දෙමළ ලෙස සඳහන් වීම නිසා විශ්වවිද්‍යාලවලට ප්‍රවේශ වීමේදී මුදල් ගෙවීමට සිදු වූ අවස්ථා, රැකියා සඳහා බඳවා නොගැනීම, උසස් වීම් ලබා ගැනීමට නොහැකි වූ අවස්ථා ආදී බොහෝ කාරණා පෙන්වා දිය හැකියි.

උතුරු නැගෙනහිර ජීවත්වන ශ්‍රී ලාංකික දෙමළ ජනතාවට ඔවුන්ටම ආවේනික භාෂා ශෛලියක්, සිරිත් විරිත්, ඇදහිලි විශ්වාස තියෙනවා. ඒ වගේම අනිත් ප්‍රදේශවල ජීවත්වන දෙමළ ජනතාවටත් ඔවුන්ටම අනන්‍ය වූ භාෂා රටාවක්, සිරිත් විරිත් තියෙනවා. අපිටම වෙන් වුණ අනන්‍යතාවක් තියෙන නිසා තමයි අපි දීර්ඝ කාලයක් තිස්සේ ඉල්ලන්නේ මලයහම් ජන වර්ගයක් ලෙස පිළිගන්න කියලා. විශේෂයෙන්ම උතුරු නැගෙනහිර ජීවත්වන දෙමළ ජනතාවට සියයට අනූවකට වඩා තමන්ගේ කියන භූමියක අයිතියත් තියෙනවා. නිවාස තියෙනවා. නමුත් අනිත් ප්‍රදේශවල ජීවත්වන බහුතරයකට සියයට අනූවකට වඩා තමන්ගේ කියා නිවසක් නැහැ. ඒ විතරක් නෙවෙයි උතුරු නැගෙනහිර ජීවත්වන ජනතාව භුක්ති විඳින බොහෝ අයිතිවාසිකම් අපිට ලැබෙන්නේ නෑ. ඒ නිසා සමස්ත දෙමළ ප්‍රජාවම ශ්‍රී ලාංකික දෙමළ ලෙස සඳහන් කිරීම සුදුසු නැහැ.

සුරේෂ් පෙන්වා දෙන ආකාරයට ලාංකික දෙමළ ලෙසින් පෙනී සිටියහොත් ඔවුන්ට අහිමි වී ඇති එක් අයිතිවාසිකමක් හෝ දිනා එයින් ඔවුන්ගේ අනන්‍යතාව නැත්තටම නැති වී යන බව ද ඔහු පවසයි.

'මලයහ තමිලර්' ප්‍රජාවගේ අයිතිවාසිකම් මෙතෙක් පැවති සෑම මැතිවරණ වේදිකාවකම ප්‍රසිද්ධ මාතෘකා විය. එනමුත් ඔවුන්ගේ බොහෝ අයිතිවාසිකම් දිනා ගැනීමට මෙතෙක් හැකි වී නැත. මැතිවරණ අපේක්ෂකයන්ට ඉහළ පුටුවලට යෑමට ඒවා දිනවා දෙන බවට සපථ කිරීම පමණක් සෑහුණි. ඔවුන්ට ඉහළට යන්නට මලයහම් ජනතාවගේ කප්පරක් දුක් කඳුළු අත්වැලක් කර ගත් බව පමණක් පෙනෙන්නට තිබේ.

ජාතික ප්‍රතිපත්ති සම්පාදනයේ දී මගහැරුණු 'මලයහ තමිලර්' ප්‍රජාව

'මලයහ තමිලර්' ප්‍රජාවට ලැබෙන බොහෝ අධාර උපකාර ලැබෙන්නේ ඉන්දිය රාජ්‍ය අනුග්‍රහයෙනි. මලයහම් ජනතාවට නිවාස, විදුලිය, වැසිකිළි පහසුකම්, නළ ජලය, පාසල් ගොඩනැගිලි ආදී පහසුකම් බොහෝමයක් ලැබී ඇත්තේ ඉන්දිය රජයේ ව්‍යාපෘති හරහාය. 'මලයහ තමිලර්' ප්‍රජාවේ අයිතිවාසිකම් හා සුබසාධනය වෙනුවෙන් කටයුතු කළ යුතු, වගවිය යුතු පුද්ගලයන් සේම රාජ්‍ය ආයතන ද නිහඬ පිළිවෙතක් අනුගමනය කරයි. එසේම වෙනම අනන්‍යතාවක අවශ්‍යතාවයක් හෝ වැදගත්කමක් හෝ ඔවුන්ගේ තෝරා පත් කළ නියෝජිතයන්ට නැති බව ජේ. සුරේෂ් පෙන්වා දෙයි.

උතුරේ ජීවත්වන ශ්‍රී ලාංකික දෙමළ ජනතාව වෙනුවෙන් වෙන් කරන ප්‍රතිපාදන කඳුකර දෙමළ ජනතාව වෙනුවෙන් වෙන් වෙන්නේ නෑ. මලයහම් ජනතාව වෙනුවෙන් හෝ ඒ ප්‍රදේශවලට ලැබෙන සංවර්ධන ව්‍යාපෘති සියල්ලම වගේ ඉන්දිය ණය හෝ ආධාර මත ලැබුණු ඒවා. ඒ කියන්නේ අපි ලංකාවේ ජීවත් වුණාට අපි ගැන වගකීමක් ලංකාවේ රජයට නැද්ද?

අවුරුදු දෙසියයකටත් වඩා කල් අපි ජීවත්වන රට, අවුරුදු දෙසීයකටත් වඩා අපි දාඩිය, මහන්සිය වගුරලා උපයලා බදු ගෙවපු රට, අපි ඉපදෙන මැරෙන රට, අපි ආදරේ කරන රට, අපේ හැමදේම ලංකාව වෙද්දි අපි කැමති නෑ ඉන්දියානු දෙමළ කියලා අපිව හඳුන්වනවට. ඒක අපිට ආඩම්බරයක් නෙවෙයි. ඒක අපිට වේදනාවක්. අපිව ප්‍රතික්ෂේප කිරීමක් විදියටයි අපිට දැනෙන්නේ. අපිට ලාංකික දෙමළ ලෙසින් හෝ ඉන්දියානු දෙමළ ලෙසින් පෙනී සිටීමේ වුවමනාවක් නෑ. අපි කැමති 'මලයහ තමිලර්' නමින් අපිව හඳුන්වනවට. ඒක අපිට ගෞරවයක්."

නොබෙදී එකට එක් වන්නට 'මලයහ තමිලර්'

සුරේෂ්ගේ කතාබහට ඌන පූර්ණයක් එක් කළේ විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ එම්. ප්‍රදීපන් ය. "ජන වර්ගය සඳහන් කිරීම පිළිබඳ සමාජයේ මතවාද කිහිපයක් තියෙනවා. ඇතැම් පිරිසක් ඉන්දියානු දෙමළ විදියට පෙනී සිටින්න කැමතියි. තවත් සමහරු ශ්‍රී ලාංකික දෙමළ ලෙසින් පෙනී සිටිනවා. තවත් පිරිසක් කියනවා ජාතික දේශපාලන යාන්ත්‍රණය තුළ අනෙක් ප්‍රජාවන්ට ලැබෙන අයිතිවාසිකම්, වරප්‍රසාද ලැබෙනවා නම් ලාංකික දෙමළ ලෙසින් පෙනී සිටීමේ ගැටලුවක් නැහැ කියලා. එවැනි ඕනෑම මතයක් දැරීමේ අයිතියක් වගේම නිදහසක් තියෙන නිසා අපිට ඒක වැරදියි කියන්න බැහැ. නමුත්, වෙනම අනන්‍යතාවයක් ගොඩනගා ගැනීමේ වැදගත්කම සියලු දෙනාම අවබෝධ කර ගත යුතුයි. මේ වන විට දිස්ත්‍රික්ක ගණනාවක විසිරී ජීවත් වන කඳුකර දෙමළ ජනතාව එහෙමත් නැත්නම් 'මලයහ තමිලර්' ප්‍රජාව තේරුම්ගත යුත්තේ ඉන්දියානු දෙමළ, ශ්‍රී ලාංකික දෙමළ හෝ 'මලයහ තමිලර්' ලෙස බෙදී වෙන් වී කටයුතු කිරීමෙන් ජාතික දේශපාලනයට එක් වීමේ ඉඩකඩ සීමා වෙනවා. ඒ කියන්නේ දේශපාලන යාන්ත්‍රණය තුළ ප්‍රජාව වෙනුවෙන් වෙන් කළ කෝටාව පවා අහිමි වෙන්න ඉඩකඩ තියෙනවා. ඒ විතරක් නෙවෙයි අධ්‍යාපනයට හා රැකියාවට කරන අලගර් සෙල්වරාජු ය.



අලගර් සෙල්වරාජු

ප්‍රදීපන්



ජීවරත්නම් සුරේෂ්

"මලයහම් දෙමළ" ජනතාව ලංකාවෙ දිස්ත්‍රික්ක 13 කටත් වඩා විසිරිලා ජීවත් වෙනවා. දීර්ඝ කාලයක ඉඳන් අපි අදුනගෙන තිබුණා මලයහම් දෙමළ ජනතාවට විශේෂ වූ අනන්‍යතාවයක් අවශ්‍ය බව. ඒ නිසාම 'සිවිල් සංවිධාන රාශියක් එකතු වෙලා බොහෝ කාලයක් මේ පිළිබඳ රජයට පැහැදිලි කිරීම් කළා. ඒකෙ ප්‍රතිඵලයක් විදියට තමයි ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ ජන සංගණනයේ ජන වාර්ගික ලැයිස්තුවට 'මලයහම් තමිලර්/ මලයහ දෙමළ' ජන වර්ගයක් ලෙස ඇතුළත් කර ගන්න පුළුවන් වුණේ.

නමුත් සංගණනය සිදුකළ ඇතැම් නිලධාරීන් තමන්ගේ අභිමතය අනුව මෙවරත් ඉන්දිය දෙමළ ලෙස සඳහන් කර තිබුණා. එම නිලධාරීන් කිසිදු අවස්ථාවක ජනතාවගේ කැමැත්ත පිළිබඳ විමසා තිබුණේ නෑ. රත්නපුර, කෑගල්ල, යටියන්තොට, නුවරඑළිය වගේ ප්‍රදේශවලින් එවැනි සිදුවීම් වාර්තා වුණා. ඒ පිළිබඳ පැමිණිලි කිරීමට පවා සිදු වුණා. අපි ජනවාර්ගික ලැයිස්තුවට මලයහම් තමිලර් ජන වර්ගයක් ලෙස ඇතුළත් කර ගැනීමට දීර්ඝ කාලයක් බලන් හිටියා. සටන් කළා. නිකන්ම ඉඳලා ලැබුණු දෙයක් නෙවෙයි මේ දේ.

ඉතින් අපිට පේන්න තිබුණෙ ඒ පිළිබඳ අවබෝධයක් නැති නිසි පුහුණුවක් නැති නිලධාරීන් සේවයේ යොදවා තිබුණා කියලා. අවම වශයෙන් තමන් නියෝජනය කිරීමට කැමති කුමන ජනවර්ගය ද යන්න විමසීමටවත් උනන්දු වූයේ නෑ. ජනවාර්ගික ලැයිස්තුවට මලයහම් තමිලර් ජන වර්ගයක් ලෙස ඇතුළත් කිරීම අපේ ජයග්‍රහණයක් සහ අපිට එය සතුටක්. නමුත් නුපුහුණු නිලධාරීන් නිසා ඒ සතුට අපිට සම්පූර්ණයෙන්ම විඳගන්නට නොහැකි වුණා. මතුවට පැවැත්වෙන සංගණනයන් නිවැරදිව සිදු වුවහොත් එදාට තමයි අපිට ඇත්තටම සතුටුවෙන්න පුළුවන්."

● සෝබා කෝලියවංශ

උපාලි නිව්ස්පේපර්ස් (පුයිවට්) ලිමිටඩ් විසින් 2025 පෙබරවාරි මස 09 වැනිදා ඉරිදා හෝමාගම පිහිටි උපාලි මුද්‍රණාලයේ මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.